# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,875 — 1931ක්වූ අගෝස්තු මස 14 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

#### සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් බදු විකිණීමයි.

වම් 1931ක්වූ පෙබරවාරි මස 13වෙනි දින නිකුත් අංක 7,830 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ වම් 1931ක්වූ ජනවාරි මස 31වෙනි දින හා අංක 22 දරණ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීමෙහි ඇතුළත්වූ කරමිට යන ගම සිතිවී මෙහි පහත සඳහන්වෙන රජසන්තක ඉඩම් කොටස්වල බද්ද සබරගමුවේ ආණ්ඩුවේ දිසාපති උන්නාන්සේ විසින් වම් 1931ක්වූ සැප්තැම්බර් මස 28වෙනි දිනවූ සඳුද පෙරවරු 11ට රත්නපුරේ කච්චේරියේදී විකිණීමට දමනු ලැබේ. ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීමක් යටතේ සීමාකරණලද වෙන්දේසියෙන් විශෙෂ විකිණීම් වගන්ති අනුව මෙම විකිණීම් කරනු ලැබේ. එම විශෙෂ වගන්තිවල පිටපතක් කච්චේරියෙන් ඉල්ලා බලාගත හැක.

අවසාන ගම් සිතියමේ (ප්ලෑන්) අංකය 39. ගම—කරමිට. කෝරළය—නවදුන්. දිස්ත්‍රික්කය—රත්නපුර.

විස්තර—තේ ඝ.

| පිඹු කෑල්ල. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | ප්‍රමාණය. අ. රූ. ප. | අක්කරයකට මුද්‍රිත් ගෙවියයුතු මුදල වසයෙන් වෙන්දේසිය පටන් ගන්නා මිල. රු. ශ. | ප්‍රථම වම් 30දී අවුරුද්දකට අක්කරයකට ගෙවියයුතු බද්ද: ප්‍රථම වම් 6යේ එක් එක් වම්යට. රු. ශ. | ප්‍රථම වම් 30දී අවුරුද්දකට අක්කරයකට ගෙවියයුතු බද්ද: ඉතිරි වම් 24රේ එක් එක් වම්යට. රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 80 | හින්මොරවක් ඇල්ලේ හේන්යාය ආදිය | ඩග්ලස් ඇම්. බෙරී | 117 3 9 | | | |
| 80T | හින්මොරවක් ඇල්ලේ හේන්යාය | ඩග්ලස් ඇම්. බෙරී .. | 3 3 38 | 5 50 | 1 0 | 3 0 |
| 80X | එම .. | ඩග්ලස් ඇම්. බෙරී | 0 2 36 | 3 0 | | |

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර තොරතුරු සබරගමුවේ ආණ්ඩුවේ දිසාපති උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් (ප්ලෑන්) සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැක.

වම් 1931ක්වූ අගෝස්තු මස 4වෙනි දින කොළඹ
ඉඩම් කොමසාරිස්තැනගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෞන්,
ඉඩම් කොමසාරිස්තැන.

---

### ඉඩම් බදුදීමේ දැන්වීමයි.

වම් 1930ක්වූ පෙබරවාරි මස 1වෙනි දින දරණ ඉඩම් විවෘතකිරීමේ නොම්මර 12 දරණ දැන්වීමේ අඩංගු වම් 1930ක්වූ පෙබරවාරි මස 7වෙනි දින නොම්මර 7,759 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරනලද මෙහි පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම් වම් 1931ක්වූ ඔක්තෝබර් මස 2වෙනි දින පස්වරු 1.45ට බදුල්ල කච්චේරියේදී ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් ඉඩම් බදුදීම හෙවත් විකිණීම සම්බන්ධව පනවාතිබෙන විශෙෂ රෙගුලාසිවල ප්‍රකාර සීමාසහිත වෙන්දේසියේ බදුදෙනු ලැබේ. ඒවායේ දැනගැන්ම සඳහා පිටපත් බදුල්ල කච්චේරියේදී බලාගත හැකිය.

F. V. P. අන්තිම ගම් සිතියමේ නො. 26 දරන උඩුකිඳ මහපලාත කෝරළේ ඇත්තලපිටියේ ගම පිහිටි.

| පිඹු කෑල්ල | ඉඩමේ නම. | විස්තර. | ප්‍රමාණය. අ. රූ. ප. | අක්කරයකට මැනුම් ගාස්තුව. රු. ශ. | වෙන්දේසිය පටන් ගන්න අක්කරයක ප්‍රිමියම් ගණන. රු. ශ. | පළමු තිස් අවුරුද්දට අක්කරයකට අවුරුද්දක බද්ද: එක එක පළමු හය අවුරුද්දට. රු. ශ. | පළමු තිස් අවුරුද්දට අක්කරයකට අවුරුද්දක බද්ද: එක එක ඉතිරි විසිහතර අවුරුද්දට. රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| 3BI | වැලේපතන .. | පතන .. | 1 3 31 .. | — .. | 12 60 .. | 4 20 .. | 12 60 |

| | | | | | | පලමු තිස් අවුරුද්දට අක්කරයකට අවුරුද්දකට බද්ද. | |
|---|---|---|---|---|---|---|---|
| බිම් කැල්ල. | ඉඩමේ නම. | විස්තර | ප්‍රමාණය. අ. රූ. ප. | අක්කරයකට මැනුම් ගාස්තුව. රු. ශ. | වෙන්දේසිය පටන් ගන්න අක්කරයක ප්‍රිමියම් ගණන. රු. ශ. | එක එක පලමු හය අවුරුද්දට. රු. ශ. | එක එක ඉතිරි විසිහතර අවුරුද්දට. රු. ශ. |
| 3BL | වැවේපතන .. | පතන .. | 13 1 12 .. | — .. | 12 60 .. | 4 20 .. | 12 60 |
| 63CC | ගොඩහින්නේපතන .. | එම .. | 22 2 0 .. | — .. | 12 60 .. | 4 20 .. | 12 60 |
| 3AY | වැවේපතන ... | එම .. | 24 2 33 .. | — .. | 12 60 .. | 4 20 .. | 12 60 |

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 7වෙනි දින කොළඹ
ඉඩම් කොමිසාරිස්තැනගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෞන්,
ඉඩම් කොමිසාරිස්තැන වමහ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1911ගේ 10වෙනි ආඥාපණතේ 3වෙනි වගන්තියෙන් ප්‍රකෘතිමත් වර්ෂ 1876ගේ 3වෙනි ආඥාපණතේ 6වෙනි වගන්තියේ ප්‍රකාර ක්‍රියාකරණ ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් මෙහි පහත දක්වන ඉඩම් ප්‍රසිබ කටයුත්තක් සඳහා, එනම්:—බ්ලර්ස් පාර කොළඹ ගාළු පාරට දික්කිරීම පිණිස උවමනා බැවින් ඒ ඉඩම් යුතුප්‍රකාර අයිතිකරගැණීමට අණලබනලදී, ඒ ඉඩම්නම්:—

ප්‍රාරම්භ පැලෑන නො. 20,275. ගම—කොල්ළුපිටිය.

| ඉඩම් කට්ටිය. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම කියාසිටින අයගේ නම. | විශාලකම. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ලොරිස් පාරේ 38වෙනි ලේන් එකේ වරිපනම් නො. 5ගේ කොටසක් දරණ ඉඩම | මල්පාත්ති, හුණෙන් බැඳි බිත්තියක කොටසක්, ලිඳෙරක කොටසක්, පාවිච්චි නොකරණ පරණ පාරක කොටසක තිබෙන ලීගේට්ටුවක කොටසක් | කොළඹ උසාවිය පාරේ පදිංචි ඒ. බී. සත්‍යකල්සිංහ | 0 0 1·55 |
| 2 | එම .. | හුණෙන් බැඳ උළු සෙවිලිකළ ගොඩනැගිල්ලක කොටසක්ද, හුණෙන් බැඳි සෝප්පුවක කොටසක්ද, කානුවක්ද, කානුවක කොටසක් සහ පඩියක්ද, පෝදිසිවලක්ද, කත්කුස්සිකානු පසිප්ප කොටසක්ද, ගලියක්ද, තාපකොටසද, ගොඩනැගිල්ලක කොටසක් සහ තගරන් සහ ලීවලින් එකතුකළ කොටසක්ද, ලීගේට්ටුවක කොටසක්ද, අවුරුදු 20–30 වයසැති පොල්ගස් 2ක්ද, අවුරුදු 25ක් වයසැති කොස්ගහක්ද ඇති ඉඩම | එම | .. 0 0 14·42 |
| | | | | 0 0 15·97 |

ඒ නිසා එකී ආඥාපණතේ 7වෙනි වගන්තියේ නියමවූ ප්‍රකාර ඉහතකී ඉඩම් අයිතිකරගැණීමට අදහස්කරණ බැව් මෙයින් ප්‍රකාශකරමි.

තවද එකී ඉඩම් ගැණ සැලකීමක් ඇති සියළුදෙනාම ඔවුන්ගේ අයිතිවාසිකමේ අන්දමද, ඒ වෙනුවට ඉල්ලාසිටින වටිනාකමද, ඊට අයිති ඔප්පුද, රිජිස්ටර් පොතේ කොපියක්ද රැගෙණ ඉඩම් ගැන වටිනාකම ලැබීමට තිබෙන යුතුකම්ද පෙන්වාසිටින පිණිස තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය හෝ වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 7වෙනි දින පෙරවරු 10ට කොළඹ නාගරිකසභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණෙන්ට ඕනෑය.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 14වෙනි දින කොළඹ
නාගරිකසභා කන්තෝරුවේදීය.

ඩබ්ලිව්. ටී. ස්ටේස්,
කොළඹ නාගරික සභාවේ සභාපතිතැන සහ නගරාධිපතිතුමා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ජාඇල කොටදෙනියාව පාර දියුණුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 19,716. ගම—පත්තඹුවාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වල්ජපලාවත්ත .. | පොල්ගස් 28ද, රබර්ගස් 8ද, පුවක්ගස් 69කින්ද යුත් පොල් සහ රබර් ඉඩම | ආණ්ඩුව සහ බී. ඇස්. ප්‍රනාන්දු | .. 0 1 23 |
| 2 | එම .. | පොල්ගස් 4ද, රබර්ගස් 6කින්ද යුත් පොල් සහ රබර් ඉඩම | එම | .. 0 0 8·3 |
| | | සිතියමේ නො. 19,717. ගම—පත්තඹුවාන. | | |
| 1 | එම .. | පොල්ගස් 8කින් යුත් පොල්ඉඩම .. | ආණ්ඩුව සහ බී. ඇස්. ප්‍රනාන්දු | .. 0 0 8·4 |
| 3 | එම .. | පොල්ගස් 9ද, රබර්ගස් 5ද, කජුගස් 4කින්ද යුත් පොල් සහ රබර් ඉඩම | එම | .. 0 0 6·2 |
| 5 | එම .. | පොල්ගස් 7ද, රබර්ගස් 6කින්ද යුත් පොල් සහ රබර් ඉඩම | එම | .. 0 0 5·6 |
| 6 | එම .. | පොල්ගස් 24ද, රබර්ගස් 15ද, රබර් පැල 4ද, කජුගහක්ද, පුවක්ගස් 7ද, කොස්ගහකින්ද යුත් පොල් සහ රබර් ඉඩම | එම | .. 0 0 20·7 |
| 8 | එම .. | පොල්ගස් 4ද, රබර්ගස් 3ද, පුවක්ගස කින්ද යුත් පොල් සහ රබර් ඉඩම | එම | .. 0 0 4·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇතතාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 14වෙනි දින පෙරවරු 10ගේ කාහිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 10වෙනි දින
කොළඹ කච්චේරියේදිය.

එච්. ෂී. කැෆ්ජමන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වමහ.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—බෝවෙන රෝග වැලදී ගෙවල්වල පදිංචිකාරයින් වෙන්කර නැවැත්වීමේ කූඩාරම විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබිතිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 9,094. ගම—මහනුවර නාගරික සීමාව තුල පිහිටි දෙයියන්නෙවෙල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඇසැස්මන්ට් නො. 17 දරණ හපුගස්පිටියේවතත, ආරෝග්‍යශාලාවට යනපාර | වත්ත .. | දෙයියන්නෙවෙල, නැසීගිය පූලාගේ උරුමක්කාරයින් අලුත්නුවර ඩී. එච්. කලූවා, දෙයියන්නෙවෙලේ ඩී. එච්. මැනිකී, ඩී. එච්. රන්කිරී, ඩී. එච්. උක්කුවා සහ ඩී. එච්. පොඩිසිංඤෝ | 0 2 1·48 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 18වෙනි දින පස්වරු 2කේ කාලයට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 10වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොඩ්සෝල්,
මහනුවර පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ලේවැල්ලට ප්‍රසබ වැසිකිලියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රි සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 9,096. ගම—මහනුවර නාගරික සීමාවතුල පිහිටි තල්වත්ත.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මාලිගාවවතත (ලේවැල්ලපාරේ) ඇසැස්මන්ට් නො. 40 දරණ ඉඩමෙන් කොටසක් | මුඩුබිම .. | දලදා මන්දිරයේ භාරකාරයින්: බදුකාරයා: තල්වත්තේ කේ. බී. විජේසිංහආරච්චි, බදුකාරයා විසින් පවරනලද දෙවෙනි බදුකාරයා: කොළඹ මල්වැවිලි කරණ විලියම් සහ රිචර්ඩ්ස් මහත්වරු | 0 0 10 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 18වෙනි දින පස්වරු 2කේ කාලයට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 10වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොඩ්සෝල්,
මහනුවර පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දුම්රිය පාරේ ප්‍රවේශම සඳහා වැව බිඳහැරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 8,046. ගම—වන්නාත්තල්ලුපුලියංකුලම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වන්නාත්තල්ලුකම්ම .. | කුඹුර .. | අලෙලකල්ලුපෝච්චකුලමේ පදිංචි මාරිමුත්තු ආරුමුකම් සහ ඔහුගේ පුත්‍රයා (හමුලේ) | 6 3 20·4 |
| 2 | එම .. | එම .. | අලෙලකල්ලුපෝච්චකුලමේ පදිංචි මාරිමුත්තු පලනිගේ පුත්‍රයා පලනි නාගලිංගම් (ලාබාලයා) | 2 0 32·4 |
| 3 | එම .. | එම .. | අලෙලකල්ලුපෝච්චකුලමේ පදිංචි මාරිමුත්තු ආරුමුකම් .. | 0 2 0·8 |
| 4 | එම .. | එම .. | වන්නාත්තල්ලුපුලියංකුලමේ පදිංචි කරුප්පන් රාමයාමි .. | 2 1 15 |
| 5 | වන්නාත්තල්ලුකාඩු .. | මුඩුබිම .. | වන්නාත්තල්ලුපුලියංකුලමේ පදිංචි කරුප්පන් රාමසාමි සහ ඔටුන්න | 0 0 22·1 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැන්ගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 29වෙනි දින පෙරවරු 10යේ කාලයට වවුනියාවේ උසාවියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 11වෙනි දින
මුල්ලද්දුවේ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පොලියර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

## වැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

මෙහි පහත සඳහන්වෙන කාලවල්වලට බස්නාහිර දිසාවේ මෙහි පහත සඳහන්වන තෝටුපල් රේන්ද පළමු ගැනුම්කාරයින් විසින් වර්ෂ 1931ක්වූ ජූලි මාසේ මාස් මුදල හෝ එයින් හිඟහිටපු යම් කොටසක් වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 25වෙනි දිනදී නොහොත් ඒට ප්‍රථම දිනකදී නොගෙව්වොත් ඔවුන්ගේ අලාබේ වෙනුවට එකී රේන්ද වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 25වෙනි අඟහරුවාද දවල් 12ට කොළඹ කච්චේරියේදී නැවත විකුණන බව මෙයින් දන්වනුය.

නැවත විකිණීමේදී ගැනුම්කාරයින් විසින්ගේත් මුදලෙන් දහයෙන් කොටසක් විකිණීමේ දවසේදී මෙහි තබන්ට ඕනෑය.

නැවත විකිණීමේදී රේන්ද විකුණන්ට බැරිවුනොත් වර්ෂ 1905යේ නොම්මර 21 දරණ ආඥාපණතේ ප්‍රකාරයට පළමු ගැනුම්කාරයින්ට විරුඬව ක්‍රියාකරනු ලැබේ.

වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 1වෙනි දින පටන් වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වාය.

1. මීගොමුව ඇල රේන්ද.
2. කිත්තන්පහුවේ ඇල රේන්ද.

ඇම්. ඇම්. වැඩර්බර්න්,
බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 6වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් 1932ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දිනෙන් අවසාන මාස කාලයට මෙහි පහත සඳහන්වෙන බස්නාහිර පලාතේ තොටුපල් රේන්ද මිලේට ගැනීම පිණිස දෙන වෑන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 28වෙනි සිකුරාදා දවල් 12ට කොළඹ කච්චේරියේදී බස්නාහිර පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

මෙහි පහත දක්වන එක එක රේන්දයට වෙන වෙනම වෑන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර දියයුතුයි.

භාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් දෙළොස් මාසයට ගත් මුදලෙන් දහයෙන් කොටසක් මුදල්වලින් වහාම මෙහි තබන්ට ඕනෑය. එම ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් භාරගන්ට යෙදුනොත්නම්, ඔහුගේ ඉල්ලීම උතුමාණන්වහන්සේ විසින් ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30 දවසක් ඇතුලතදී 12 මාසයකට ඉල්ලූ ගණනින් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තිබා සම්පූර්ණකරන්ට ඕනෑය.

ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ පෙරකදෝරු මහත්වරුන්ට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද, ඒවා සෝදිසිකර සම්පූර්ණකෙරීමටද, ඉඩම් තක්සේරු කිරීමට සහ ඇප ඔප්පු රෙජිස්තර්කෙරීමටද, වර්ෂ 1909ක්වූ 22වෙනි ආඥාපණත අන්දමට ඔප්පුවලට අලවන්ට ඕනෑ මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවන්ට ඕනෑය.

ඇප වෙනුවෙන් තිබනලද ඉඩම්වල ඔප්පු, ඒවා මීට ප්‍රථම ඇපෙකට නොහොත් උකසකට යටත්නැති බවට ඉඩම් ලියාපදිංචිකරණ රෙජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍ර ලබාගැණීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින් දරිය යුතුයි.

මේ ගැණ වැඩිදුර කාරණ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

ප්‍රධාන පාරවල්වල පාලම් රේන්ද.

ගෑන්ඩිපාස්—සැන්සෙබැස්තියම් ඇල රේන්දය.
අයකරන ස්ථානය.

ගෑන්ඩිපාස්එක සේදවත්තට යාවන පාලමේ ගෑන්ඩිපාස් එක පැත්තෙන්ය.

ඇම්. ඇම්. වැඩර්බර්න්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 11වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

වර්ෂ 1932ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට දෙසැම්බර් මස 31වෙනි දිනෙන් අවසන්වන අවුරුද්දට මෙහි පහත සඳහන්වන කොළඹ දිස්ත්‍රික්කයේ තොටුපල් රේන්ද මිලේට ගැනීම පිණිස දෙන වෑන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 15වෙනි කුජ දින දවල් 12ට කොළඹ කච්චේරියේදී කොළඹ දිස්ත්‍රික්කයේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැන විසින් භාරගනු ලැබේ. මෙහි පහත සඳහන්වන එක එක රේන්දයට වෙන වෙනම වෑන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර දියයුතුයි.

භාරගන්නාලද ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා විසින් ගත් මුදලෙන් දහයෙන් කොටසක් මුදල්වලින් වහාම මෙහි තබන්ට ඕනෑය. එම ඉල්ලීම කොමිටියේ ප්‍රධානතැන විසින් භාරගන්ට යෙදුනොත්නම් ඔහුගේ ඉල්ලීම ඒත්තුගත් බව දැනුම්දුන් දින පටන් 30ක් දවසක් ඇතුලතදී ඉල්වූ ගණනෙන් දෙකෙන් පංගුවකට වඩා වටිනා ඇප ඒත්තුගත් ඔප්පුවලින් හෝ තුනෙන් පංගුවකට වටිනා ඇප මුදලෙන් හෝ තබා සම්පූර්ණ කරන්ට ඕනෑය.

ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා කොමිටියේ පෙරකදෝරුතැනට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමවද, ඒවා සෝදිසිකර සම්පූර්ණකිරීමටද, ඉඩම් තක්සේරුකිරීමට සහ ඇප ඔප්පු රෙජිස්ටර්කිරීමටද වර්ෂ 1909ක්වූ 22වෙනි ආඥාපණත (අර්ත්වැඩියාකරණලද 1917 නො. 16 පණත) අන්දමට ඔප්පුවලට ඇලවියයුතු මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවන් ඕනෑය.

ඇප වෙනුවෙන් තබනලද ඉඩම්වල ඔප්පු මීට ප්‍රථම ඇපෙකට නොහොත් උකසකට යටත්වී නැතිබවට ඉඩම් ලියාපදිංචිකරණ රිජිස්ත්‍රාර්තැනගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍රය ලබාගැනීමට ඕනෑකරණ වියදම ඇපතබන අය විසින් දරිය යුතුයි.

යම් වෑන්ඩරයක් හෝ වෑන්ඩර්ස් සියල්ලම ප්‍රශ්නයක් නැතිව ප්‍රතික්ෂෙපකිරීමේ බලය කොමිටියේ ප්‍රධානතැන වෙත තබාගන්ට යෙදුනා ඇත.

මේගැණ වැඩිදුර කාරණ කොළඹ දිස්ත්‍රික්කයේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැනගෙන් ඉල්ලුම්කළවිට දැනගන්ට පුළුවන.

1. හංවැල්ලේ තොටුපල් රේන්දය.
2. පූගොඩ තොටුපල් රේන්දය.
3. වෑවල තොටුපල් රේන්දය.
4. හේනේමුල්ල, ගොරකපොල, දිග්ගල සහ එගොඩ උයන තොටුපල් රේන්ද.
5. සීදුවේ තොටුපල් රේන්දය.
6. මුතුවාඩියේ තොටුපල් රේන්දය.

(*a*) ඉල්ලුම්කරුවන් විසින් සීදුව සහ මුතුවාඩියේ තොටුපල් රේන්ද දෙක ගැණ එක වෑන්ඩරයක්ද,

(*b*) එම තොටුපල් රේන්ද දෙක ගැණ වෙන් වශයෙන් වෑන්ඩර් දෙකක්ද දිය යුතුයි.

හේනේමුල්ල, වෑවල සහ ගොරකපොල තොටුපල් රේන්ද ගන්නාවූ අය මිනිසුන් පමණක් එගොඩ මෙගොඩ කරන්ට ඕනෑබවත් ඒ පිණිස කොළඹ දිස්ත්‍රික්කයේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැන පිළිගත් ඔරු තමන්ගේ වියදමෙන් තබන්ට ඕනෑ බවත් දැනුම්දෙනු ලැබේ.

ඇම්. ඇම්. වැඩර්බර්න්,
කොමිටියේ ප්‍රධානතැන.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 11වෙනි දින කොළඹ
දිස්ත්‍රික්කේ රෝඩ්කොමිටි කන්තෝරුවේදීය.

---

## අන්‍ය දැන්වීම්.

කොළඹ දිස්ත්‍රික්කුවේ සියනෑකෝරළේ ගගබොඩපත්තුවේ පැලහැල පදිංචි දොන් තිමෝතියස් අමරකෝන් යන මම කෑගල්ල දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුමෙන් පත්කරන පිණිස මෙවක්පටන් තුන්මාසයක් ගිය තැනදී රෙජිස්ට්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලුම්කරන බව වර්ෂ 1907යේ අංක 1 දරණ ආඥාපනතේ 1B දරණ උපලේඛනයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ඩී. ටී. අමරකෝන්.

1931 ජූලි 20,
පැලහැල.

---

ගාල්ලේ ගිංතොට පදිංචි අදොනිස් ද සිල්වා සමිටම්බි විසින් ඔහුගේ ඇටෝර්නි බලය මාතර පොල්වත්තේ පදිංචි ජෙන්රිස් මර්තේනිස් සමරවික්‍රමට ඩී. පී. කොඩිතුවක්කු නොතාරිස් මහත්මයා සහතිකකළ වර්ෂ 1931 මැයි මස 30 දින සහ අංක 9,506 දරන ඔප්පුව පිට දෙන්ට යෙදුනා ඇත.

11. 7. 31. ඒ. ඩී. ඇස්. සමිටම්බි,

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.